(© Nekath.lk – Download By http://www.nekath.lk )

# තත්කාලීන නිමිත්තේ හෙළි නොවුණු ඇත්ත

දීර්ඝ කාලයක සිට ගුප්ත විද්‍යාවේ පිහිට පතන ඔබ තත්කාල නිමිත්ත එසේත් නැතිනම් තත්කාලයෙන් ශාස්ත්‍ර කීම පිළිබඳව දැන සිටිනවා විය හැකග ඇතැම් විට ඔබ එවන් තැනක ගොස් පලාපල විමසා දැන ගෙන සිටිනවා විය හැකග ජන වහරේ මේ ගුප්ත විද්‍යාත්මක ක්‍රමවේදය හඳුන්වන්නේ නිමිත්තක් අල්ලනවා යනුවෙනිග අද වන විට මේ ගැඹුරු විද්‍යාව මෙතරම් සරළ නමකින් හැඳින්වුවද පුරාතනයේ මෙම ශාස්ත්‍රය දිවැස් බලයක් ලෙස ලොව පුරා විකාශනය වූ බවක් පෙනෙන්නට තිබෙයිග උතුම් අධිගමලාභීහු අවබෝධ කර ගන්නා ඥාන අතර (පරචිත්ත විජානන ඥානය) සෑම සත්වයෙකුගේම සිත් පිළිබඳව වටහා ගැනීමේ නුවණ ප්‍රමුඛස්ථානයක් ගනී. ඒ ඥානය තුළින් සෑම කෙනෙකුගේම සිතේ පවතින චිත්ත ස්වභාවයල සිතේ පවතින අරමුණු, ඔහුගේ අතීත වර්තමාන අනාගත ජීවන තත්වය ආදී කොට ඇති සකළවිධ කාරණා දැනගත හැකිය. මේ උතුම් වූ ධර්මඥානය ලොව්තුරා බුදුන් වහන්සේ ආදේශනා ප්‍රාතිහාර්යය ලෙසින් දෙසා වදාළ සේක. එසේ නමුත් මේ කියන ලද ආදේශනා ප්‍රාතිහාර්යය ලෝකයා හමුවේ පෑම බුදුන් වහන්සේ බොහෝ පිළිකුලෙන් යුතුව බැහැර කළහ. දීඝ නිකායේ කේවඩ්ඩ සූත්‍රය විමර්ෂණය කරන කල්හි එයට හේතුව අප හට මැනවින් පසක් වේ.

තත්කාල නිමිත්ත පිළිබඳව විමර්ෂණය කිරීමේදී කේවඩ්ඩ සූත්‍රය ඈඳා ගැනීම උචිත දැයි ඔබ සිතන්නට පුළුවන. ගුප්ත විද්‍යාව හෝ නූතන විද්‍යාව බෞද්ධ දර්ශනය සමඟ සැසඳීම නිරර්ථක නිශ්ඵල ක්‍රියාවකි. ඇතැම් හු බෞද්ධ දර්ශනය විද්‍යාත්මක යැයි පවසති. පුහුදුන් සිතේ උපදින විද්‍යාව සාපේක්ෂ මතයන්ගේ විකාශනයක් විනා පරම සත්‍යක් නොවේ. නූතන විද්‍යාව විසින් තමන් පිළිබඳව අද එළඹෙන්නා වු නිගමනය හෙට එයට සාපේක්ෂව වෙනත් මතයක් බවට පත් වේ. නිදසුනක් ලෙස යම් වස්තුවක තවදුරටත් නොබෙදිය හැකි කුඩාම අංශුව පරමාණුව බව විද්‍යාඥයෝ මුළින්ම ලොවට හෙළි කළහ. නමුත් අද සිටින විද්‍යාඥයෝ පරමාණුව තව දුරටත් බෙදිය හැකි බවට නව මතයන් ඉදිරිපත් කරති. මේ තත්වය තුළ බෞද්ධ දර්ශනය නූතන විද්‍යාව හා සම කළ හැකිද?. ලෝක විෂය පිළිබඳවත් ලෞකික ලෝකෝත්තර විෂයයන් පිළිබඳවත් බෞද්ධ දර්ශනයේ සඳහන් නිගමනයන් නූතන විද්‍යාව හා සැසඳීමේදී නූතන විද්‍යාව තවමත් මන්දගාමී ගමනක යෙදෙන බව කිව යුතුය. එසේ නමුත් බෞද්ධ දර්ශනයේ ගැබ් වූ විද්‍යාඥානය නූතන විද්‍යාඥයාගේ ගමන ඉක්මන් කිරීම සඳහා අද ඉවහල් කර ගන්නා බව පෙනෙන්නට තිබේ. බුද්ධ ඥානයෙන් දුටු අනන්ත වු විශ්වය නූතන විද්‍යාවේ තාක්ෂණික මෙවලම් තුළින් දකින්නට හැකි වේ දැයි සිතිය නොහැක. එසේ නමුත් ආධ්‍යාත්මික අධිගමනයන් තුළින් මේ විශ්වයේ අරුමය දකින්නට අනාගත විද්‍යාඥයා පෙළඹෙනු ඇතැයි අනුමාන කළ හැකිය. මේ සඳහා බුද්ධ දර්ශනය හා අනෙකුත් ආගමික දර්ශනයන් ඔවුන් උපයුක්ත කර ගන්නවා ඇත. ඒ අතර ගුප්ත විද්‍යාව ද මොවුන්ගේ ඇස ගටෙනු නිසැකය.

(© Nekath.lk – Download By http://www.nekath.lk )

(© Nekath.lk – Download By http://www.nekath.lk )

(© Nekath.lk – Download By http://www.nekath.lk )

ලෞකික විෂයක් ලෙස ගුප්ත විද්‍යාව වැදගත් තැනක් ගනී. ජීවත් වන්නන්ගේ අනේක විධ ගැටළු අරඹයා ගුප්ත විද්‍යාව විසින් සහනදායී පිළිතුරු ලබා දෙයි. ඒ නිසාම අද වන තෙක් මේ මා හැඟි විද්‍යාව නානා විධ වෙනස් වීම්වලට භාජනය වෙමින් ඉදිරියට ගමන් කරයි. ගුප්ත විද්‍යාව තුළ සැඟවුණු සත්‍ය සොයා යන ගමනේ අද දවසේ අපේ මාතෘකාව වූ තත්කාල නිමිති ශාස්ත්‍රය යනු කුමකිදැයි විමසා බලමු. ඔබට යම් ගැටළුවක් පැන නැගුණු අවස්ථාවක බුලත් හුරුල්ලක් හා පඬුරු මුදලක් ගෙන ජ්‍යොතිෂ්ශාස්ත්‍රඥයෙකු වෙත යාම සිදු කරයි. එහිදී ඔහු ඔබගෙන් කිසිවක් නොවිමසා බුලත් අත ගෙන ඔබ පැමිණි වේලාවට කේන්ද්‍රයක් සාදා පලාපල කියන්නට පටන් ගනී. එහිදි ඇතැම් විටක සියයට සියයක්ම ඔබේ සිතේ ඇති දේ කියවෙයි. තත්කාල නිමිත්ත බලන්නා දක්ෂයෙකු නම් එය එසේම වෙයි. සැබැවින්ම මෙය පරචිත්ත විජානන ඥානය තරම් නොවුණත් දිව්‍යස් බලයකට සමාන කළ හැක්කකි. බුදුරජාණන් වහන්සේ කේවඩ්ඩ සූත්‍රය තුළින් මේ ගුප්ත විද්‍යාත්මක ක්‍රමවේදය * මණිකා ශාස්ත්‍රය නමින් හැඳින්වූහ. මෙම මණිකා ශාස්ත්‍රය භාරතයේ බොහෝ දෙනා දැන සිටි නිසා බුදුන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට එක් අවවාදයක් දුන්හ. එනම් තැන තැන ගොස් ආදේශනා ප්‍රාතිහාර්යය (අනුන්ගේ සිත දැන පැවසීම) නොකරන ලෙසය. මෙයට එක් හේතුවක් ඇත. එනම් ශ්‍රද්ධාවක් නැති අය විසින් මේ උතුම් වූ ආදේශනා ප්‍රාතිහාර්යය මණිකා ශාස්ත්‍රයට සම කොට කතා කරන බැවිනි. මේ කියන ලද මණිකා ශාස්ත්‍රයත් අද අපි කතා කරන තත්කාල නිමිති ශාස්ත්‍රයත් සමාන බැව් මගේ නිගමනයයි. මේ ගුප්ත ශාස්ත්‍රයන් දෙකෙන්ම සිතේ ඇති දේ අතැඹුලක් සේ පවසයි. එසේ නම් නූතන තත්කාල නිමිත්ත මණිකා ශාස්ත්‍රයේම ප්‍රගමනයක් විය හැක.

තත්කාල නිමිති ශාස්ත්‍රය අතිශයින්ම විද්‍යාත්මක පදනමක් මත ගොඩ නැගෙන බව මගේ ගවේෂණ තුළින් අත් දුටුවෙමි. නමුත් වර්තමාන ලෝකයේ මෙම විෂය කොතරම් දුරට නිවැරදිව භාවිතා කරන්නේ ද යන්නට දිය හැකි පිළිතුර පාඨක ඔබ අත්දැකීමෙන් දන්නා බව මම සිතමි. මේ ලිපිය කියවන ඔබත් යම් දිනක තත්කාල නිමිති ශාස්ත්‍රයේ පිහිට සොයා තැන තැන යන්නට ඇත. එසේ නැතිනම් අනාගතයේ හෝ එවන් තැනකට යනු ඇත. එහිදී ඇතමෙක් නිවැරදි පලාපල ඔබ ඉදිරියේ පවසන්නට ඇත. එයින් ඔබ සෑහීමට පත් වී මේ මහා ශාස්ත්‍රය පිළිබඳව පැහැදුණු සිතින් තවමත් පසුවනවා විය හැක. තවත් තත්කාල නිමිති බලන්නෙකු ඔබේ වටිනා කාලයත් මුදලත් විනාශ කොට ඔබ මුළා කරමින් මුසා බස් පවසන්නට ඇත. ඒ නිසාම ඔබ මේ ශාස්ත්‍රය හෙළා දකිමින් මෙය මහා මිත්‍යාවක් ලෙස ගැරහුමට ලක් කරන්නට ඇත. මෙහිදී ඔබ හෝ මේ උතුම් ශාස්ත්‍රය හෝ වැරදිකරුවන් නොවේ. මේ ශ්‍රේෂ්ඨ විද්‍යාව විශ්වවිද්‍යාල මට්ටමින් අධ්‍යයනය කළ යුතු පසුබිමක තිබියදී එය මුදල් පසුපස හඹා යන විජ්ජාකරුවන් අතට පත් වීමේ ඵලවිපාක අද ඔබ අත් විඳිනවා නොවේද?

(© Nekath.lk – Download By http://www.nekath.lk )

(© Nekath.lk – Download By http://www.nekath.lk )

(© Nekath.lk – Download By http://www.nekath.lk )

බොහෝ දෙනෙකු සිතා සිටින්නේ ගුප්ත විද්‍යාත්මක සංකල්ප පෙරදිග ලෝකයට පමණක් සීමා වී ඇති බවයි. නමුත් සත්‍යයය එය නොවේ. මේ මහා විද්‍යාව ලොව පුරා ප්‍රචලිත වූවක් බව ඔබේ දැන ගැනීම පිණිස දක්වමි. අද අපි කතා කරන තත්කාලීන නිමිති ශාස්ත්‍රය දියුණු යැයි සැළකෙන යුරෝපා රටවලද බහුල ලෙස භාවිතා කරයි. බොනපාට් නිමිත්ත යුරෝපා රටවල ඉතා ප්‍රසිද්ධ නිමිති ක්‍රමයකි. යම් හෙයකින් නූතන විද්‍යාඥයා ගුප්ත විද්‍යාව ගැඹුරු ලෙස අධ්‍යයනය කරන්නේ නම් ඔහුට විශ්වය පිළිබඳ නියම තතු නොබෝ දිනකින්ම වටහා ගැනීමට හැකි වෙතැයි මම සිතමි. ඒ සඳහා මාවතක් මේ ලිපි පෙළින් සැකසේවි යැයි අදහස් කරමි. ඒ සඳහා විද්වත් පාඨක ඔබගේ මධ්‍යස්ථ මතය මහත් පිටුවහලක් වන්නේමය. තත්කාල නිමිති ශාස්ත්‍රයේ විද්‍යාත්මක පැතිකඩ කෙබඳු දැයි විමසා බලමු. එහිදී තත්කාල නිමිති ශාස්ත්‍රය තුළින් පලාපල කථනය සඳහා බලපාන්නා වූ මූලික ශක්තීන් කිහිපයක් හඳුනා ගතිමි. මේ ශක්තීන් සියල්ල නිවැරදි ලෙස එකතැන් වූ පසු සියයට සියයක් නිවැරදි වූ පලාපල ඔබ විස්මයට පත් වන අයුරින් කිව හැකි වේ. එසේ නම් එම ශක්තීන් මොනවාද?.

### කාලය හා අවකාශය

කාලය හා අවකාශය(ඒජැ'බා එසපැ) පිළිබඳව විවිධ විෂය පථයන් ඔස්සේ ගැඹුරින් අධ්‍යනය කරන යුගයක අපි ජීවත් වන්නෙමු.එහිදී විවිධ පෙර අපර දෙදිග විද්‍යාත්මක හා ආගමික න්‍යායන් විසින් එළඹෙන්නා වූ පොදු මතයක් ලෙස ආපෝ,තේජෝ, වායෝ,පඨවි යන සතර මහා භූත කොට්ඨාශ කාලය හා අවකාශයට නතුව පවතින්නේය යන අදහස ගෙන හැර පායි.මෙයටත් වඩා වෙනස් වූ මතයන්ද තිබිය හැක.මෙසේ කාලය හා අවකාශය පිළිබඳව විවරණය කිරීමේදී මෙම දාර්ශනිකයෝ ගුප්ත විද්‍යාව පිළිබඳව හැදෑරුවාද යන්නට ප්‍රමාණික කරුණු මට සොයාගත නොහැකි විය.ඇතැම්විට ඔවුහු මේ ගුප්ත විද්‍යාව අතහැර දැමුවා විය හැක.නමුත් යම් හෙයකින් ඔවුන් මේ මාහැඟි ගුප්ත විද්‍යාව ගැඹුරින් අධ්‍යනය කළේ නම් කාලය හා අවකාශය පිළිබඳ නව දර්ශනයක් ලොවට හෙළි කරනවා ඇත. මෙය පුළුල් මාතෘකාවක් නිසා පළමු කොට තත්කාල නිමිත්තට කාලය හා අවකාශය සම්බන්ධ වන්නේ කෙසේදැයි විමසා බලමු. තත්කාල නිමිති ශාස්ත්‍රඥයා වෙතට නිමිත්තක් ඇසීම සඳහා යම් පුද්ගලයෙකු පැමිණෙයි. දැන් ශාස්ත්‍රඥයා විසින් ඔහු ඉදිරියේ ඇති (අවකාශය තුළ සිටින) සේවාදායකයා උදෙසා පලාපල කථනය කළ යුතු වේ.එහිදී ඔහු පැමිණි කාරණය ඇසීම තහනම්ය. සේවාදායකයා ලබාදෙන පඬුර හා බුලත් අත බාර ගැනීම පමණක් ඔහු සිදු කරයි.ඉන් පසුව මේ නිමිති ශාස්ත්‍රඥයා විසින් සේවාදායකයා තම අවකාශයට පැමිණි වෙලාව සටහන් කරයි.මෙහිදී සිදු වූයේ කුමක්ද? නිමිති ශාස්ත්‍රඥයාගේ අවකාශීය බල සීමාවට පැමිණ ඉඩහසර ලබා ගත් භෞතික වස්තුව (සේවාදායකයා) කාලයට නතු කර ගැනීම නොවේද? මෙය කාලය හා අවකාශය අතර සිදු වන අන්‍යෝන්‍ය ක්‍රියාවලියකි.මේ දෙයින් පමණක් පලාපල කිවහැකි යැයි ඔබ සිතන්නේදරැ් කොහෙත්ම නොහැක.තවත් කරුණු ගණනාවක් මේ සඳහා බලපානු ඇත.

(© Nekath.lk – Download By http://www.nekath.lk )

(© Nekath.lk – Download By http://www.nekath.lk )

(© Nekath.lk – Download By http://www.nekath.lk )

## අන්තරීක්ෂ බල සටහන

තත්කාල නිමිති ශාස්ත්‍රඥයාට අතිශයින්ම උපයුක්ත වන්නා වූ සාධකය මෙයයි.තම සේවාදායකයා පැමිණි නිවැරදි වේලාවට ශාස්ත්‍රඥයා විසින් මෙහිදී ග්‍රහචාරයන්ට අනුව බල සටහනක් ගොඩනංවනු ලබයි.මෙය තත්කාල කේන්ද්‍රය ලෙස සාමාන්‍ය ව්‍යවහාරයේ හඳුන්වයි.සේවාදායකයා පැමිණි වේලාව ඇතුළත අවකාශය තුළ හිරු,සඳු ආදී කොට ඇති නවග්‍රහයින් පිහිටා තිබුනේ කෙසේදැයි එම බලසටහනින් ශාස්ත්‍රඥයා හඳුනා ගනී.එහිදී ඔහු කේන්ද්‍රයක තිබිය යුතු සියලුම ජ්‍යෝතිෂ්‍ය සංඥා මොනවාද යන්න සටහන් කර ගනී.

මේ ග්‍රහබල සටහනේ ඒ ඒ ග්‍රහයන් සිටි ස්ථානය අනුව සේවාදායකයාගේ හිතේ ඇති දේ කුමක්දැයි කියන්නට ශාස්ත්‍රඥයාට දැන් හොඳාකාරවම පුළුවන.එහෙත් නියම ශාස්ත්‍රඥයා එසේ ඉක්මන් වන්නේ නැත. මීළඟට ඔහු තවත් පැතිකඩක් වෙත යොමු වෙයි.

## අවකාශය තුළ සේවාදායකයාගේ හැසිරීම

තමා ඉදිරියේ සිටින සේවාදායකයාගේ හැසිරීම් පිළිබඳව නිරීක්ෂණ සටහන් තබා ගැනීම නිමිති ශාස්ත්‍රඥයාගේ මීළඟ අරමුණයි. එහිදී තම සේවාදායකයා

- බලා සිටින දිශාව උතුර,නැගෙනහිර ආදී අට දිශා
- තම අත්ලෙන් ශරීරයේ අල්ලාගෙන සිටින ප්‍රදේශය
- බලා සිටින මුහුණත උඩ,යට,මැද,අවට ආදී
- සේවාදායකයා තමා සමඟ කතා කළ මුල්ම වචනයේ මුල් අකුර
- මීට අමතරව බුලත් හුරුල්ලද පරීක්ෂා කරයි.

මේ නිරීක්ෂණ සටහන් තුළින් සේවාදායකයාගේ සිතේ පවතින දේ සත්‍යය ලෙසින්ම පවසන්නට දැන් ශාස්ත්‍රඥයාට හැකිය.නමුත් ඔහු තවදුරටත් සංයමයෙන් යුතුව තවත් කාර්යයක් සඳහා යොමු වේ.

## විද්‍යුත් චුම්භක තරංගීය චිත්ත බලය

සෑම පුද්ගලයෙකු වටාම විද්‍යුත් චුම්භක තරංගීය චිත්ත බලයක් පවතින බව ඔබ දන්නවා ඇතැයි සිතමි.මේ බලයට තමා අවට සිටින අය හා චිත්ත සංනිවේදනයක යෙදෙන්නට හැකියාවක් ඇත. මේ විද්‍යුත් චුම්භක තරංගීය බලය අනෙකාගේ සිතුවිල්ල හඳුනා ගැනීමට සමත් වෙයි. එයට සරල උදාහරණයක් දැක්විය හැක. ඔබ නිවසේ අය සමඟ යම් පුද්ගලයෙකු ගැන මතක් කරමින් හෝ ඔබ තනිව ඔහු ගැන සිහි කරමින් සිටින අවස්ථාවක ඔබ පුදුමයට පත් කරමින් ඒ පුද්ගලයා එතනට පැමිණේ. එවිට ඔබ මෙසේ පවසා ඇතිවාට සැක නැත. ඔයා නම් ලේසියෙන් මැරෙන්නෑ. දීර්ඝායුෂ තියෙනවා. මේ මතක් කරා විතරයි, සැබවින්ම මෙහිදී සිදු වූයේ කුමක්ද? ඔබගේ විද්‍යුත් චුම්භක තරංගීය අවකාශය තුළට ඒ

(© Nekath.lk – Download By http://www.nekath.lk )

(© Nekath.lk – Download By http://www.nekath.lk )

(© Nekath.lk – Download By http://www.nekath.lk )

පුද්ගලයාගේ පැමිණීම කල් තියා සංනිවේදනය වීම නොවේද? සත්‍යය එයයි. ඒ නිසා ඔහු මතකයට නැගුණ අතර සැනෙකින් ඔහුගේ පැමිණීමද සිදු විය. මෙයටත් වඩා අති ප්‍රබල සංනිවේදන ජාලයක් තත්කාල නිමිති ශාස්ත්‍රඥයා හා සේවාදායකයා අතර දැන් සිදු වෙයි.එය සිදුවන්නේ වචන හෝ අංග චලන ලෙසින් නොවේ.චිත්ත තරංග ලෙසිනි. මෙයද තත්කාල නිමිති ශාස්ත්‍රයේදී අතිශයින් වැදගත් වන්නකි. දැන් සියල්ල පරිපූර්ණය. මේ වන විට ශාස්ත්‍රඥයා සතුව පලාපල කීමට තරම් ප්‍රමාණික කරුණු රාශියක් සැකසී ඇත.ඉහත කියන ලද කරුණු සියල්ල පදනම් කරගනිමින් ශාස්ත්‍රඥයා අවසාන නිගමනය කරා එළඹෙයි. එය ධාතු-මූල-ජීව නියමය ලෙස ගුප්ත විද්‍යාවේ හැඳින්වෙයි. මේ න්‍යාය පදනම් කර ගනිමින් පරීක්ෂණ,නිරීක්ෂණ,නිගමන ඔස්සේ තත්කාලීන නිමිති ශාස්තඥයෝ මිනිසුන්ගේ ජීවිත පලාපල කියන්නට සමත් වෙති. දිවැස් බලයක් බඳු මේ ගුප්ත විද්‍යාත්මක ක්‍රමවේදය යමෙකු නියමාකාරයෙන් භාවිතයට ගන්නේ නම් එයින් කළ හැකි සේවය අපමණය. කාලය හා අවකාශය හසුරුවන ගාමක බලවේගයක් ලෙස මෙහිදී විශ්ව බලය ක්‍රියා කරයි. එම විශ්ව බලය විසින් කාලය හා අවකාශය මනා ලෙස විවරණය කරන අවස්ථාවකි මේ කියන ලද තත්කාලීන නිමිති ශාස්ත්‍රය.

**උපුල් එස් දොඹේපොළ,**

**පුරාණ අන්තරීක්ෂ විද්‍යා ගවේෂක,**

(© Nekath.lk – Download By http://www.nekath.lk )

(© Nekath.lk – Download By http://www.nekath.lk )